සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
மகளிர் சிறுவர் அலுவல்கள் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
Ministry of Women, Child Affairs and Social Empowerment

මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/07/2024 - චක්‍රලේ
ඔබේ අංකය / உமது இல / Your No: ........................
දිනය / திகதி / Date: 2024.07.02

*චක්‍රලේඛ :- සමාජ සංවර්ධන චක්‍රලේඛ 2024/10*

*සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,*

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂවරුන්,

සියළුම විෂයභාර දිස්ත්‍රික් සමාජ සංවර්ධන/ප්‍රජාමූල කළමනාකරුවන්

සියළුම කළමනාකරුවන්,

සියළුම සමාජ සංවර්ධන සහකාරවරුන්,

සියළුම සංවර්ධන නිලධාරීන්,

සියළුම ප්‍රජාමූල විෂයභාර සංවර්ධන නිලධාරීන්

සියළුම ප්‍රාදේශීය සංවිධානවල සභාපතිවරුන් හා ලේකම්වරුන්,

සියළුම ප්‍රජාමූල සංවිධානවල සභාපතිවරුන් හා ලේකම්වරුන් වෙත.

**ජාත්‍යන්තර දුම්වැටි හා මත්විරෝධී දිනට සමගාමීව පවත්වන ලද**

**කොඩි වැඩසටහනේ රැස් කරන ලද මුදල් වැය කිරීම හා ඇගයීම් ක්‍රියාවලිය**

**01. හැඳින්වීම**

2013 අංක 01 දරණ පනතේ 10 වන වගන්තියේ (අ) (ඒ) හා 16 වන වගන්තියේ (ඉ) හි සඳහන් පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා 11 වන වගන්තියේ (උ) හා 17 වන වගන්තියේ (ඒ) හි සඳහන් බලතල අනුව ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව පවත්වන ලද සමෘද්ධි කොඩි වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිකුත් කළ සමෘද්ධි චක්‍රලේඛ අංක ජාත්‍යන්තර දුම්වැටි හා මත්ද්‍රව්‍ය විරෝධි දිනය - 2024/08 මගින් එක්රැස් කර සමෘද්ධි කොඩි මුදල් අදාළ කාර්යයන් සඳහා වැය කිරීම සඳහා අවශ්‍ය කරන මග පෙන්වීම හා උපදෙස් ලබාදීම හා ඇගයීම් ක්‍රියාවලිය සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛනය නිකුත් කරනු ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**02. සමෘද්ධි කොඩි නිකුත් කිරීම මගින් සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය මුදල් රැස්කිරීම හා සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය වෙත ප්‍රේෂණය කිරීම**

2.1 සමෘද්ධි කොඩි නිකුත් කිරීම මගින් රැස් කරන ලද මුදල් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ආදායමක් වන අතර සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය කොඩි නිකුත් කිරීමෙන් මුදල් රැස්කර ඒවා ලේඛනගත කිරීමෙන් පසු සමෘද්ධි බැංකුවේ පවත්වාගෙන යන නිළ ඉතිරි කිරීමේ ගිණුමට තැන්පත් කළ යුතුයි.

2.2 සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ නිළ ඉතිරි කිරීමේ ගිණුමට තැන්පත් කළ සමෘද්ධි කොඩි මුදල් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය විසින් සමෘද්ධි බැංකු සමිතියේ පවත්වාගෙන යන නිළ ඉතිරි කිරීමේ ගිණුමට ප්‍රේෂණය කිරීම සඳහා සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ගරු භාණ්ඩාගාරික හා ගරු සභාපති හෝ ගරු ලේකම් විසින් ලිඛිත ඉල්ලීමක් සමෘද්ධි බැංකු කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

2.3 සෑම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් විසින්ම රැස් කරන ලද සියළුම සමෘද්ධි කොඩි මුදල් අනිවාර්යයෙන්ම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ නිළ ඉතිරි කිරීමේ ගිණුමට තැන්පත් කිරීම පිණිස සමෘද්ධි බැංකු සමිතිය වෙත චෙක්පතක් මගින් යැවිය යුතුයි. මෙය සෑම ප්‍රජාමූල සංවිධානයකම ගරු භාණ්ඩාගාරික හා ගරු සභාපති හෝ ගරු ලේකම්ගේ මෙන්ම බැංකු කළමනාකරුගේ ද අනිවාර්ය රාජකාරියකි.

2.4 රැස් කරන ලද සමෘද්ධි කොඩි මුදල් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් සමෘද්ධි බැංකුවේ පවත්වාගෙන යන නිළ ඉතිරි කිරීමේ ගිණුමේ රඳවා තබා ගනිමින් වියදම් කිරීම සඳහා අවසර දෙනු නොලැබේ.

**03. සමෘද්ධි කොඩි නිකුත් කිරීම මගින් රැස් කරන ලද මුදල් වියදම් කිරීම**

3.1 සෑම සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයක් විසින්ම රැස්කළ සමෘද්ධි කොඩි මුදලින් වියදම් කිරීම සඳහා වසම්භාර සමෘද්ධි නිළධාරීන්ගේ හා අදාල බැංකු කළමනාකරුගේ අධීක්ෂණය මත ව්‍යාපෘතිය යෝජනා මහාසභා රැස්වීමේදී ඉදිරිපත් කර සභා සම්මත කරගත යුතුයි.

3.2 සමෘද්ධි කොඩි නිකුත් කිරීමෙන් රැස්කළ මුදල් සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ සාමාජිකත්වය ලබාගත් අඩු ආදායම්ලාභීන් හා ඔවුන්ගේ දරුවන්ගේ සුභසාධන කටයුතු , සෞඛ්‍ය, අධ්‍යාපන, සංස්කෘතික, අධ්‍යාත්මික හා මත්ද්‍රව්‍ය නිවාරණ

වැඩසටහන් සඳහා පමණක් වැය කළ යුතුයි. විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයින් සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුවේ.

උදා: නිවාස ඉදිකිරීම, පාසල් ලිපිද්‍රව්‍ය, පොත් ලබාදීම ශිෂ්‍යත්ව ලබාදීමත් සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම්, කැකුළු ළමා සංස්කෘතික වැඩසටහන

3.3 සමෘද්ධි කොඩි නිකුත් කිරීමෙන් රැස්කළ මුදල් අඩු ආදායම්ලාභීන් නොවන අයගේ සුභ සාධනය සඳහා වූ ව්‍යාපෘති සඳහා වැය නොකළ යුතුය.

උදා: ප්‍රජා ශාලා ඉදිකිරීම, මාර්ග ඉදිකිරීම හා පිළිසකර කිරීම, සමෘද්ධි බැංකුවට කාර්යාල උපකරණ මිලදී ගැනීම, විනෝද චාරිකා සඳහා.

3.4 සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් සභා සම්මත කරගන්නා ලද ව්‍යාපෘති යෝජනාව හෝ යෝජනා ගරු ලේකම් විසින් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු සභාපති වෙත ඉදිරිපත් කිරීම පිණිස සමෘද්ධි ප්‍රජා මූල සංවිධානයේ ගරු සභාපති වෙත ලබාදිය යුතුයි. (ඇමුණුම - I අනුව)

3.5 සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු සභාපති වෙත සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මගින් ඉදිරිපත් කෙරෙන සියළුම ව්‍යාපෘති යෝජනා ගරු ලේකම් විසින් විධායක සභාව වෙත ඉදිරිපත් කළ යුතුයි. විධායක සභාව විසින් එම ව්‍යාපෘතිවල අවශ්‍යතාව හා ඵලදායීතාවය පිළිබඳව සලකා බලා ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර රැස්කළ සමෘද්ධි කොඩි අරමුදලෙන් උපරිම 85% ක වටිනාකමක් ඉක්මවා නොයන පරිදි අනුමත කළ යුතුය. ප්‍රතික්ෂේප කරන ලද ව්‍යාපෘති යෝජනා පිළිබඳව අදාළ ප්‍රජාමූල සංවිධානයට ලිඛිතව දැනුම් දිය යුතුයි.

3.6 සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ විධායක සභාව විසින් අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා ඇස්තමේන්තුගත වියදම සමඟ මහ සභා රැස්වීමේදී සභා සම්මත කරගත යුතුයි.

3.7 සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය මගින් සභා සම්මත කරගන්නා ලද ඇස්තමේන්තු ගත වියදම ඇතුළත් (සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මගින් රැස්කළ සමෘද්ධි කොඩි මුදලින් 85% උපරිමයකට යටත්ව) ව්‍යාපෘති යෝජනා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම පිණිස සමාජ සංවර්ධන සහකාර නිළධාරියාගේ සහ සමෘද්ධි බැංකු සමිතියේ සමිති කළමනාකරුගේ නිර්දේශය ලබාගෙන ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුයි. (ඇමුණුම් - II අ, ආ,ඇ අනුව)

ව්‍යාපෘතිය යෝජනාව අනුමත කිරීමේදී රු. 100,000/- දක්වා ප්‍රාදේශීය ලේකම් විසින් ද, රු. 100,000- සිට රු. 200,000/- දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ විසින් ද රු. 200,000/- ට වැඩි අගයන් සඳහා අධ්‍යක්ෂ ජනරාල් විසින්ද අනුමත කළ යුතුයි.

3.8 ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබාගත් ඇස්තමේන්තු ගත ව්‍යාපෘති ඇතුලත් ලේඛනය සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු ලේකම් හා සභාපතිගේ අත්සනින් යුත් ආවරණ ලිපියක් මගින් සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ කළමනාකරු වෙත ඉදිරිපත් කළ යුතුයි.

3.9 සමෘද්ධි කොඩි නිකුත් කිරීමෙන් රැස් කරන ලද මුදලෙන් 85% න් 80%ක් ප්‍රජාමූල සංවිධාන හරහා අනුමත ව්‍යාපෘති යෝජනා සඳහාත්, 5%ක් ප්‍රාදේශීය සංවිධාන මගින් කරනු ලබන ව්‍යාපෘති සඳහාත් වන පරිදි අනුමත ව්‍යාපෘති සඳහා වැය කළ පසු ඉතිරි 5% ක මුදල දිස්ත්‍රික් කාර්යාලයේ සමාජ සංවර්ධන හා ප්‍රජාමූල වැඩ කටයුතු සඳහා දිස්ත්‍රික් කාර්යාලය අයත් ප්‍රාදේශීය සංවිධානයේ ගිණුමට දිස්ත්‍රික් කාර්යාලය නමින් බැර කළ යුතුය. අනතුරුව කොඩි වැඩසටහන නිමවී මසක් ඇතුලත 10% ක මුදල කොඩි, කැටලේබල්, පෝස්ටර්,ස්ටිකර් මුද්‍රණ කටයුතු හා එහි අනෙකුත් වියදම්, ඇගයීම් කටයුතු හා ජාතික මට්ටමේ සමාජ සංවර්ධන වැඩසටහන් සඳහා යොදා ගැනීමට "සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදල" ගිණුම් අංක 0080012772 ට චෙක්පතකින් ආවරණ ලිපියක් සහිතව ප්‍රජාමූල සංවිධාන අංශයට ලබා දිය යුතුය. ආවරණ ලිපියේ පිටපතක් සමාජ සංවර්ධන අංශයට එවිය යුතු වේ.

සමෘද්ධි චක්‍රලේඛ ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දින 2024/08 චක්‍රලේඛනයේ 6වන ඡේදයේ I හා II අනුව වාර්තා සකස් කළයුතු අතර එහිදී රඳවා ගත් 90% දිස්ත්‍රික් කාර්යාලය සඳහා 5ක් හා ප්‍රාදේශීය සංවිධානයේ 85 වෙන වෙනම සටහන් කර එවිය යුතු වේ.

## 04. අනුමත ව්‍යාපෘති සඳහා වැය කිරීම පිණිස මුදල් නිදහස් කිරීම

4.1 රැස්කළ සමෘද්ධි කොඩි මුදලින් අනුමත ව්‍යාපෘති සඳහා මුදල් වැය කිරීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ "වියදමක්" වන අතර අදාල වියදම් සිදුකිරීමේ දී ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ විධායක සභාව, ග්‍රාම නිළධාරී වසම භාර සංවර්ධන නිළධාරී, කලාප සහකාර ලෙස කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිළධාරී, බැංකු කළමනාකරු, සමාජ සංවර්ධන සහකාර සහ සමෘද්ධි සමිති කළමනාකරු යන අයගේ පූර්ණ මැදිහත්වීම හා සහයෝගය මත සිදුවිය යුතුයි

4.2 එක් එක් අනුමත ව්‍යාපෘති සඳහා මුදල් නිදහස් කිරීමේ දී සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු භාණ්ඩාගාරික, ගරු සභාපති හෝ ගරු ලේකම් ගේ අත්සනින් යුත් ලිඛිත ඉල්ලීමක් මත සිදු කළයුතු අතර "ඉතිරි කිරීමේ ගිණුමෙන් මුදල් ආපසු ගැනීම හර පත්‍රයක්" සම්පූර්ණ කර සමෘද්ධි ප්‍රජාමූලබැංකු සමිතිය වෙත ඉදිරිපත් කළ යුතුයි

4.3 එක් එක් අනුමත ව්‍යාපෘතිය සඳහා මුදල් නිදහස් කිරීම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය අයත් සමෘද්ධි ප්‍රජා මූල බැංකුව වෙත මුදල් ප්‍රේෂණය මගින් සිදුවන්නේ නම් ඉහත 4.2 පරිදි ලිඛිත ඉල්ලීමක් මත සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ නිළ ඉතිරි කිරීමේ ගිණුමට "බැර" පිණිස ලියන ලද චෙක් පතක් නිකුත් කිරීම මගින් සිදුකළ යුතුයි.

4.4 අනුමත ව්‍යාපෘති සඳහා වැය කිරීම පිණිස තම ප්‍රජාමූල සංවිධානයේ නිළ ඉතිරි කිරීමේ ගිණුමට ලද මුදල් බැංකු මෙහෙයුම් උපදෙස් අනුව නිදහස් කළ යුතුය.

4.5 එක් එක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය විසින් සමෘද්ධි කොඩි මුදලින් ක්‍රියාත්මක කරන අනුමත ව්‍යාපෘතිවලට අයත් සියළු වියදම් සනාථ කිරීම සඳහා විධිමත් ලෙස සකස් කළ බිල්පත්වල මුල් පිටපත් සමඟ වියදම් ලේඛනයක් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය වෙත භාරදිය යුතුය. එය සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ ගරු සභාපති ගරු ලේකම් හා ගරු භාණ්ඩාගාරිකගේ නිළ වගකීමක් වේ.

4.6 සමෘද්ධි ප්‍රජාමූල සංවිධානයේ අභ්‍යන්තර විගණක (ගිණුම් පරීක්ෂක) විසින් එම බිල්පත හා වියදම් ලේඛනය පරීක්ෂා කර බලා එහි සත්‍ය හා සාධාරණ භාවය පිළිබඳ නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ අභ්‍යන්තර විගණක (ගිණුම් පරීක්ෂක) වෙත ඉදිරිපත් කළ යුතුය.

4.7 ඉහත 4.5 පරිදි වියදම් සනාථ කිරීමට අදාළ බිල්පත් හා වියදම් ලේඛනයේ ඡායා පිටපත් ගරු සභාපති මගින් සහතික කර ගරු භාණ්ඩාගාරික විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය සතුව ගොනු කර තබා ගත යුතුයි.

4.8 අනුමත ව්‍යාපෘති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම එම වියදම් වාර්තා ගත කිරීම හා මෙම චක්‍රලේඛ උපදෙස් අනුව සමෘද්ධි ප්‍රජා මූල සංවිධානය විධිමත් ලෙස කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව අධීක්ෂණය කිරීම ග්‍රාම නිළධාරී වසම් භාර සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ පැහැර හැරිය නොහැකි රාජකාරීමය වගකීමකි.

4.9 අනුමත ව්‍යාපෘති නිසි ලෙස ක්‍රියාත්මක කිරීමෙන් පසු සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය මගින් ලැබෙන ඊට අදාල බිල්පත්වල මුල් පිටපත් හා වියදම් ලේඛන එක් එක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය වෙනුවෙන් වෙන වෙනම ගොනු කර තබා ගැනීම සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු භාණ්ඩාගාරිකගේ නිළ වගකීමකි. මහා සභා රැස්වීමේදී අනුමත ව්‍යාපෘතිවල වියදම් වාර්තා ඉදිරිපත් කිරීම ගරු සභාපති හා ගරු ලේකම්ගේ නිළ වගකීමකි.

4.10 සමෘද්ධි කොඩි මුදලින් ක්‍රියාත්මක කරන ලද අනුමත ව්‍යාපෘති පිළිබඳ සමෘද්ධි ප්‍රජාමූල සංවිධානවල අභ්‍යන්තර විගණකවරුන් (ගිණුම් පරීක්ෂක) එවා ඇති සත්‍ය හා සාධාරණ භාවය පිළිබඳ නිරීක්ෂණ වාර්තා පදනම් කර ගනිමින් සකස් කරන ලද විගණන වාර්තාවන් සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානයේ ගරු අභ්‍යන්තර විගණක (ගණන් පරීක්ෂක) විසින් මහා සභාව වෙත ඉදිරිපත් කළ යුතු අතර එහි පිටපත් සමාජ සංවර්ධන සහකාර මගින් සමෘද්ධි සමිති කළමනාකරු වෙත භාරදිය යුතුයි.

4.11 සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය විසින් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය මගින් සමෘද්ධි කොඩි මුදලින් සිදුකරන ලද සියළු අනුමත ව්‍යාපෘතිවලට අයත් කාර්යයන් පිළිබඳව අධීක්ෂණ කටයුතු සිදු කිරීම හා ප්‍රගතිය වාර්තා කිරීම සමාජ සංවර්ධන සහකාරගේ අනිවාර්ය රාජකාරී වගකීමකි.

## 05. සමෘද්ධි කොඩි මුදලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වලට අයත් වියදම් වාර්තාගත කිරීම

5.1 සමෘද්ධි ප්‍රජා මූල සංවිධාන මගින් ක්‍රියාත්මක කරන ලද අනුමත ව්‍යාපෘති වලට අයත් වියදම් වාර්තාව කොඩි අරමුදලේ වියදම් කිරීම ආරම්භ වූ දින සිට සෑම මසකම එළඹෙන මස 02 දිනට ප්‍රථම ගරු භාණ්ඩාගාරික, ගරු ලේකම් හා ගරු සභාපතිගේ අත්සනින් ග්‍රාම නිළධාරී වසම් භාර සමෘද්ධි සංවර්ධන නිළධාරී වෙත ඉදිරිපත් කළ යුතුවේ. (ඇමුණුම iii)

5.2 ග්‍රාම නිළධාරී වසම් භාර සමෘද්ධි සංවර්ධන නිළධාරී වෙත සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන වෙතින් ලද වියදම් වාර්තාවට තම නිර්දේශය සඳහන් කරමින් කලාප සහකාර වෙත සෑම මසකම එළඹෙන මස 04 දිනට පෙර භාරදිය යුතුයි. (ඇමුණුම iii)

5.3 එක් එක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය වෙනුවෙන් වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරිගේ නිර්දේශය සමඟ ලද වියදම් වාර්තාව අනුව එක හා සමාන අනුමත ව්‍යාපෘති පදනම් කර ගනිමින් සකස් කරන ලද කලාප වියදම් වාර්තාව කලාප සමෘද්ධි

කළමනාකරු විසින් සමෘද්ධි සමිති කළමනාකරු වෙත සෑම මසකම එළඹෙන මස 06 දිනට පෙර ඉදිරිපත් කළ යුතුවේ (ඇමුණුම iv)

5.4 එක් එක් කලාප සමෘද්ධි කළමනාකරු විසින් ලබාදෙන "සමෘද්ධි කොඩි මුදලින් සිදුකරන ලද අනුමත ව්‍යාපෘති වලට අදාළ කලාප වියදම් වාර්තා"පදනම් කර ගනිමින් සමාජ සංවර්ධන සහකාර විසින් ප්‍රාදේශීය වියදම් වාර්තාව සකස් කළ යුතුයි. එක් එක් සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන මගින් සිදු කරන ලද එක හා සමාන අනුමත ව්‍යාපෘති පදනම් කර ගනිමින් "සමෘද්ධි කොඩි මුදලින් සිදුකරන ලද අනුමත ව්‍යාපෘති වලට අදාළ ප්‍රාදේශීය වියදම් වාර්තාව" සමෘද්ධි සමිති කළමනාකරුගේ නිර්දේශයෙන් හා ප්‍රාදේශීය ලේකම් අනුමැතියෙන් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත සෑම මසකම එළඹෙන මස 08 ට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වේ. (ඇමුණුම v)

5.5 ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ලද "සමෘද්ධි කොඩි මුදලින් සිදුකරන ලද අනුමත ව්‍යාපෘතිවලට අදාළ ප්‍රාදේශීය වියදම් වාර්තාව" පදනම් කර ගනිමින් දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයේ සමාජ සංවර්ධන විෂය භාර සමෘද්ධි කළමනාකරු හා ප්‍රජා මූල විෂය භාර සමෘද්ධි කළමනාකරු එක්ව එක හා සමාන අනුමත ව්‍යාපෘති පදනම් කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් "සමෘද්ධි කොඩි මුදලින් සිදු කරන ලද අනුමත ව්‍යාපෘතිවලට අදාල දිස්ත්‍රික් වියදම් වාර්තාව" සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හෝ සහකාර අධ්‍යක්ෂකගේ නිර්දේශයන් හා දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ අනුමැතියෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ අධ්‍යක්ෂ වෙත සෑම මසකම එළඹෙන මස 10 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුවේ. (ඇමුණුම vi)

## 06. ජාත්‍යන්තර දුම්වැටි මත් විරෝධි දිනය මැයි 31ට සමගාමීව කොඩි පැළඳවීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම ප්‍රජා නායකයින් හා නිළධාරීන් ඇගයීම

ආර්ථික හා සාමාජීය සංවර්ධනයට ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින දුම්වැටි හා මතින් ප්‍රජාව හා දරුවන් මුදා ගැනීම සඳහා වැඩසටහන් රාශියක් මේ තුලින් සිදු කිරීමටත් ඒ හරහා ලැබෙන අරමුදල් මගින් සාමාජීය, සංස්කෘතික, සෞඛ්‍ය, පාරිසරික හා මානසික වශයෙන් ප්‍රජාව සවිබල ගැන්වීමක් සිදු කරනු ඇත.

එබැවින් ඒ සඳහා ඇප කැප වූ සියළු නිළධාරීන් හා ප්‍රජාව ඇගයීම තුළින් ඔවුන්ව අභිප්‍රේරණය කිරීම සඳහා මෙම ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ඇත.

සමෘද්ධි චක්‍රලේඛ ජාත්‍යන්තර දුම්වැටි හා මත්විරෝධි දිනය 2024/08 චක්‍රලේඛනයේ සඳහන් දිනට අනුව දිස්ත්‍රික්කයේ කොඩි පැළැඳවීම් තුලින් ඒකාරාශී කරන ලද අරමුදල් විස්තර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අත්සනින් යුතුව එවිය යුතු අතර එදිනට පසුව එවනු ලබන වාර්තා ඇගයීම් ක්‍රියාවලිය සඳහා යොදාගනු නොලැබේ. මෙහිදී දිස්ත්‍රික්කයේ කොඩි ආදායම ප්‍රජාමූල සංවිධාන සංඛ්‍යාවෙන් බෙදා සාමාන්‍ය අගය මත වැඩිම ආදායම් ලබාගත් දිස්ත්‍රික්කය තෝරනු ලබන අතර හොඳම දිස්ත්‍රික්කය කොඩි ආදායම මත තෝරාගනු ලැබේ.

6.1. ජාතික මට්ටම

<u>ඇගයුම්ලාභීන්</u>

1. දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
2. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
3. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ
4. දිස්ත්‍රික් සමාජ සංවර්ධන හා ප්‍රජාමූල විෂයයභාර කළමනාකරු
5. දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂ්‍යයභාර සංවර්ධන නිළධාරී/සමාජ සංවර්ධන සහායක

මෙම ඇගයීම් අවස්ථාව ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රකාශයට පත්කළ පසු ප්‍රථම, දෙවන, තුන්වන ස්ථානගත් දිස්ත්‍රික්ක පමණක් ඇමුණුම් vii ට අනුව ඇගයීම් වාර්තාව ඉදිරිපත් කළ යුතුවේ.

6.2 දිස්ත්‍රික් මට්ටම

වැඩිම කොඩි ආදායම් රැස්කරගත් ප්‍රාදේශීය සංවිධාන 03 තේරීම

(ප්‍රථම, දෙවන හා තෙවන)

මෙම ඇගයීම් අවස්ථාවට ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය ලබාගත් ප්‍රාදේශීය සංවිධානයේ තොරතුරු ඇමුණුම් viii ට අනුව ඉදිරිපත් කළ යුතුය

<u>ඇගයුම්ලාභීන්</u>

1. ප්‍රාදේශීය ලේකම්
2. බැංකු සමිති කළමනාකරු/ප්‍රජාමූල විෂ්‍යයභාර නිළධාරී
3. සමාජ සංවර්ධන සහකාර

4. ප්‍රාදේශීය සංවිධානය - සභාපති හෝ ලේකම්

6.3 ප්‍රාදේශීය මට්ටම

වැඩිම කොඩි ආදායම ඉපැයූ කලාපය තේරීම (ප්‍රථම, දෙවන හා තෙවන)

මෙහිදී ඔබ දිස්ත්‍රික්කයේ වැඩිම කොඩි ආදායම ඉපයූ කලාපයේ තොරතුරු ඇමුණුම් ix ට අනුව ඉදිරිපත් කළ යුතුය.

ඇගයුම්ලාභීන්

1. වැඩිම ආදායම ඉපැයූ බැංකුව
2. කලාප සභකාර
3. පාලක මණ්ඩල සභාපති

6.4 දිස්ත්‍රික්කයේ වැඩිම ආදායම ඉපැයූ ප්‍රජාමූල සංවිධාන ඇගයීම්

මෙහිදී ඔබ දිස්ත්‍රික්කයේ වැඩිම ආදායම ඉපැයූ ග්‍රාම නිළධාරී වසමේ වසම්භාර සමෘද්ධි සංවර්ධන නිළධාරී, වසම අයත් සමාජ සංවර්ධන සහකාර සහ වසම අයත් ප්‍රජාමූල සංවිධානය ඇගයීමට භාජනය කෙරේ. ඒ අනුව ඇමුණුම් x ට අනුව ඇගයීම් වාර්තාව සකස් කර ඉදිරිපත් කළ යුතු වේ.

ඇගයුම්ලාභීන්

1. වැඩිම ආදායම ඉපැයූ වසම අයත් සමාජ සංවර්ධන සහකාර
2. වැඩිම ආදායම ඉපැයූ වසම භාර සමෘද්ධි සංවර්ධන නිළධාරී
3. වැඩිම ආදායම ඉපැයූ ප්‍රජාමූල සංවිධානය - (සභාපති/ලේකම්)

6.5 ඉහත ඇගයීම් ක්‍රියාවලිය ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බැවින් ඔබ දිස්ත්‍රික්කයේ තෝරාගැනීම් සිදුකර සමාජ සංවර්ධන හා ප්‍රජාමූල විෂයභාර කළමනාකරුවන් විසින් සම්පූර්ණ කරන ලද ඇගයීම් වාර්තාව දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව සැප්තැම්බර් මස 01 දිනට ප්‍රථම email මගින් socialdev@samurdhi.gov.lk සමාජ සංවර්ධන අංශය වෙත ලබාදීමට කටයුතු කළ යුතුවේ.

07. සෑම වර්ෂයකම ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනයට සමගාමීව ක්‍රියාත්මක වන මෙම කොඩි, ස්ටිකර් හා පෝස්ටර් අලෙවිය තුළින් ඒකරාශී කරගන්නා ලද අරමුදල්වල විනිවිදභාවය කෙරේ වැඩි සැලකිල්ලක් දැක්විය යුතු වේ.

ඒ අනුව ප්‍රාදේශීය මට්ටමින් වෙන්කර ඇති 90%න් 5%ක් දිස්ත්‍රික් කාර්යාලයේ සමාජ සංවර්ධන /ප්‍රජාමූල වැඩසටහන සඳහා වෙන්කර ඇති අතර 85% ක් ප්‍රාදේශීය හා ප්‍රජාමූල සංවිධාන වැඩසටහන් සඳහා වෙන්ව ඇත. ඒ තුළින් කරන ලද සමාජ සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ භෞතික හා මූල්‍යමය ප්‍රගතිය ඔබ වෙත දැනටමත් ලබාදී ඇති ආකෘති පත්‍රයට අනුව එවිය යුතුය. (භාණ්ඩාගාර නොවන හා අනෙකුත් අරමුදල් වාර්තාවට අනුව)

දිස්ත්‍රික් කාර්යාලයට වෙන්කර ඇති 5% සම්බන්ධයෙන්ද කරනු ලබන සමාජ සංවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍යමය ප්‍රගතිය ඇතුලත් වාර්තාවද සෑම මසකම වෙනම වාර්තාවක් ලෙස ඉහත ආකෘතිය අනුවම 10 දිනට ප්‍රථම එවිය යුතුය.

ඉතිරි 10% සෑම ප්‍රාදේශීය සංවිධානයක් විසින්ම "සමෘද්ධි ජාතික සමාජ සංවර්ධන අරමුදලට" එවිය යුතු අතර ඒ සඳහා අදාල චෙක්පත සමඟ එවනු ලබන ආවරණ ලිපියේ පිටපතක් සමාජ සංවර්ධන අංශයට එවිය යුතුවේ.

08. සෑම වසරකම ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයට සමගාමීව මෙම වැඩසටහන ක්‍රියාත්මක වන බැවින් සෑම වසරකම මාර්තු මස 31 දිනට ප්‍රථම ඔබ දිස්ත්‍රික්කයට අවශ්‍ය කරන කොඩි, ස්ටිකර්, පෝස්ටර්, කැටලේබල් අවශ්‍යතාවය ප්‍රජාමූල සංවිධාන මට්ටමින් ලබාගෙන පහත ආකෘතියට අනුව සකස්කර email මගින් ලබාදීමට කටයුතු කළ යුතු වේ. අදාල දිනට පසු කරන ලද ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා බැලීමක් සිදු නොකරන බවද අවධාරණය කරමි. අදාල ආකෘති පත්‍රයේ පරිදිම අවශ්‍යතාව සටහන් කිරීම වැදගත් කොට සැලකේ.

දිස්ත්‍රික්කයේ නම ...................................

| අනු අංකය | ප්‍රා.ලේ. කොට්ඨාසයේ නම | කොඩි සංඛ්‍යාව | | කැටලේබල් සංඛ්‍යාව | | ස්ටිකර් සංඛ්‍යාව | | පෝස්ටර් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

සකස්කලේ.......... නිර්දේශ කළේ ..... අනුමත කළේ.................

09. 2024 වර්ෂයේ සිට ඉදිරියට සියළු සමාජ කණ්ඩායම් ආර්ථික, සාමාජීය, මානසික සෞඛ්‍ය හා පාරසරික වශයෙන් සවිබල ගැන්වීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීම වේ. එබැවින් සාමාජීය සවිබල ගැන්වීම උදෙසා මතින් හා දුම්වැටියෙන් තොර ප්‍රජාවක් ගොඩනගා සමාජ සංවර්ධන ක්‍රියාකාරකම් තුළින් ප්‍රජාව සවිබල ගැන්වීම උදෙසා නව්‍යතාවයකින් යුතුව වැඩසටහන් පෙලගස්වා ගැනීමටත්, ඒ සඳහා කැපවීම හා උනන්දුව, අධීක්ෂණය, වාර්තා නිසි දිනට ලබාදීම ඔබ සියළු දෙනාගේම වගකීම බවත් සිහිපත් කරමි.

**ජාත්‍යන්තර දුම්වැටි විරෝධි දිනයට සමගාමීව සමෘද්ධි කොඩි වැඩසටහන තුළින් ඒකරාශී කරන ලද අරමුදල් සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛනය පමණක් ක්‍රියාත්මක වන අතර මීට ඉහත නිකුත් කරන ලද අංක DSD/HO/09/CBO/05 කොඩි 2024.01.30 දිනැති චක්‍රලේඛනය අවලංගු වේ.**

**මෙම චක්‍රලේඛනය සම්බන්ධයෙන් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් පමණක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශයේ සහකාර අධ්‍යක්ෂ ඇමතීමට කාරුණික වන්න. ( 011-2876601, 0112-889046 හා 071-1980289)**

**සී.ඩී. කළුආරච්චි**

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :-

01. ලේකම්, කාන්තා ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය- කා.දැ.ගැ.ස.

02. ප්‍රධාන ගණකාධිකාරි - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස /අ.ක.ස

03. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස

04. සියළුම අධ්‍යක්ෂවරුන් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස

05. සභාපති, ජාතික සමාජ සංවර්ධන අරමුදල - දැ.ගැ.ස/අ.ක.ස

06. මහා සංගම් සභාපති - දැ.ගැ.ස/අ.ක.ස

**ඇමුණුම - i**

ගරු සභාපති

සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය

..............................

**සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය මගින්.........................සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය වෙත ඉදිරිපත් කරනු ලබන සමෘද්ධි කොඩ් මුදලින් ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති යෝජනා**

| **අනු අංකය** | **ව්‍යාපෘති යෝජනා** | **ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව / පුද්ගලයාගේ නම** | **අපේක්ෂිත මුදල ( රු. ශත. )** |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| **එකතුව** | | | |

**ඉදිරිපත් කළේ :**

ප්‍රජාමූල සංවිධානයේ ගරු ලේකම් ප්‍රජාමූල සංවිධානයේ ගරු සභාපති

අත්සන............................... අත්සන..................................

දිනය................................. දිනය.................................

( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව )

**නිර්දේශ කළේ :**

සමෘද්ධි සංවර්ධන නිලධාරි කලාප සහකාර සමෘද්ධි කලාප කළමනාකරු

අත්සන........................... අත්සන.......................... අත්සන.....................
දිනය............................ දිනය.............................. දිනය........................

( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව ) (නිල මුද්‍රාව )

ප්‍රාදේශීය ලේකම්

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

..................................

**................................සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය විසින් සමෘද්ධි කොඩ් මුදලින් ක්‍රියාත්මක කිරීම සඳහා සභා සම්මත කර ගන්නා ලද රු.100,000 දක්වා වූ ව්‍යාපෘති යෝජනා.**

| අනු අංකය | ප්‍රජාමූල සංවිධානයේ නම | ප්‍රමුඛතාව මත සභාසම්මත කර ගත් ව්‍යාපෘති යෝජනා | ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව / පුද්ගලයාගේ නම | අපේක්ෂිත මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

**ඉහත වගුව අනුව එකතු වූ වටිනාකම රැස්කරන ලද මුළු මුදලින් 85% ක් ඉක්මවා නොයන බවට සහතික කර ඉදිරිපත් කරමි.**

ප්‍රාදේශීය සංවිධානයේ ගරු සභාපති

අත්සන............................

දිනය...............................

( නිල මුද්‍රාව )

**නිර්දේශ කළේ :**

සමාජ සංවර්ධන සහකාර

අත්සන.............................

දිනය...............................

( නිල මුද්‍රාව )

සමෘද්ධි සමිති කළමනාකරු

අත්සන.............................

දිනය................................

(නිල මුද්‍රාව )

**අනුමත කරමි / නොකරමි.**

**................................**

**ප්‍රාදේශීය ලේකම්**

**දිනය...................**

**( නිල මුද්‍රාව )**

ප්‍රාදේශීය ලේකම් මඟින්

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

..................................

**සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය විසින් සමෘද්ධි කොඩි මුදලින් ක්‍රියාත්මක කිරීම සදහා සහා සම්මත කර ගන්නා ලද රු.100,000 – 200,000 දක්වා වු ව්‍යාපෘති යෝජනා.**

| අනු අංකය | ප්‍රජාමුල සංවිධානයේ නම | ප්‍රමුඛතාව මත සභාසම්මත කර ගත් ව්‍යාපෘති යෝජනා | ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව / පුද්ගලයාගේ නම | අපේක්ෂිත මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

**ඉහත වගුව අනුව එකතු වු වටිනාකම රැස්කරන ලද මුළු මුදලින් 85% ක් ඉක්මවා නොයන බවට සහතික කර**

**ඉදිරිපත් කරමි.**

ප්‍රාාදේශීය සංවිධානයේ ගරු සභාපති

අත්සන............................

දිනය...............................

( නිල මුද්‍රාව )

**නිර්දේශ කළේ :**

සමාජ සංවර්ධන සහකාර

අත්සන.............................

දිනය................................

( නිල මුද්‍රාව )

සමෘද්ධි සමිති කළමනාකරු

අත්සන.............................

දිනය................................

( නිල මුද්‍රාව )

**නිර්දේශ කරමි / නොකරමි.**

**.................................**

**ප්‍රාාදේශීය ලේකම්**

**දිනය...................**

**( නිල මුද්‍රාව )**

**අනුමත කරමි / නොකරමි**

**..............................**

**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**

**දිනය...................**

**( නිල මුද්‍රාව )**

ඇමුණුම - ii (ඇ )

ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ මගින්

අධ්‍යක්ෂ ජනරාල්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**................................සමෘද්ධි ප්‍රාදේශීය සංවිධානය විසින් සමෘද්ධි කොඩි මුදලින් ක්‍රියාත්මක කිරීම සඳහා සභා සම්මත කර ගන්නා ලද රු. 200,000 ට වැඩි ව්‍යාපෘති යෝජනා.**

| අනු අංකය | ප්‍රජාමුල සංවිධානයේ නම | ප්‍රමුඛතාව මත සභාසම්මත කර ගත් ව්‍යාපෘති යෝජනා | ප්‍රතිලාභ ලබන සංඛ්‍යාව / පුද්ගලයාගේ නම | අපේක්ෂිත මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| එකතුව | | | | |

**ඉහත වගුව අනුව එකතු වූ වටිනාකම රැස්කරන ලද මුළු මුදලින් 85% ක් ඉක්මවා නොයන බවට සහතික කර**

**ඉදිරිපත් කරමි.**

ප්‍රාදේශීය සංවිධානයේ ගරු සභාපති

අත්සන............................

දිනය..............................

( නිල මුද්‍රාව )

**නිර්දේශ කළේ :**

සමාජ සංවර්ධන සහකාර

අත්සන............................

දිනය...............................

( නිල මුද්‍රාව )

සමෘද්ධි බැංකු සමිති කළමනාකරු

අත්සන.............................

දිනය................................

( නිල මුද්‍රාව )

**ඉදිරිපත් කරමි / නොකරමි.**

**................................**

**ප්‍රාදේශීය ලේකම්**

**දිනය..................**

**( නිල මුද්‍රාව )**

**නිර්දේශ කරමි / නොකරමි**

**.............................**

**දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ**

**දිනය..................**

**( නිල මුද්‍රාව )**

**අනුමත කරමි / නොකරමි**

**..............................**

**අධ්‍යක්ෂ ජනරාල්**

**දිනය..................**

**( නිල මුද්‍රාව )**

**කලාප සමෘද්ධි කළමනාකරු**

**......................................**

**......................................**

**සමෘද්ධි කොඩි මුදලින් සිදු කරන ලද අනුමත ව්‍යාපෘති වලට අදාළ වියදම් වාර්තාව**

**......................................... සමෘද්ධි ප්‍රජාමූල සංවිධානය.**

| අනු අංකය | අනුමත ව්‍යාපෘතිය | ප්‍රතිලාභ ලද සංඛ්‍යාව / පුද්ගලයාගේ නම | | වැය වූ මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| **මුළු වියදම** | | | | |

**ප්‍රජාමූල සංවිධානයේ ගරු භාණ්ඩාගාරික** | **ගරු ලේකම්** | **ගරු සභාපති**

අත්සන.......................... අත්සන.......................... අත්සන..........................

දිනය............................ දිනය............................ දිනය............................

( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව )

ඉහත වියදම සත්‍ය බවට පරීක්ෂා කර සහතික කරමි.

**සමෘද්ධි සංවර්ධන සහකාර** | **සමෘද්ධි කලාප සහකාර**

අත්සන.............................. අත්සන.............................

දිනය.......................... දිනය..............................

( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව )

ඇමුණුම - **iv**

මුලස්ථාන සමෘද්ධි කළමනාකරු

.......................................

.......................................

**සමෘද්ධි කොඩි මුදලින් සිදු කරන ලද අනුමත ව්‍යාපෘති වලට අදාළ කලාප වියදම් වාර්ථාව**

**........................................සමෘද්ධි කලාපය**

| අනු අංකය | අනුමත ව්‍යාපෘතියේ ස්වරූපය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | වැය වූ මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | |
| | උදා :- 1. නිවාස ඉදිකිරීම. | | | |
| | 2. ශිෂ්‍යත්ව ලබා දීම. | | | |
| | 3. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | | | |
| | 4.............................................. | | | |
| | 5.............................................. | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| * මුළු වියදම | | | | |

✶ **සටහන :**
සමෘද්ධි ප්‍රජාමුල සංවිධාන මගින් ලද වියදම් වාර්ථා වල එකතුවට මෙම මුළු වියදම සමාන විය යුතුය.

**පරීක්ෂා කර සකස් කළේ :**

කලාප සහකාර
අත්සන..........................
දිනය............................
( නිල මුද්‍රාව )

**සහතික කළේ :**

කලාප සමෘද්ධි කළමනාකරු
අත්සන..........................
දිනය............................
( නිල මුද්‍රාව )

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

.......................................

.......................................

**සමෘද්ධි කොඩි මුදලින් සිදු කරන ලද අනුමත ව්‍යාපෘති වලට අදාළ ප්‍රාදේශීය වියදම් වාර්ථාව**

**....................................... ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය**

| අනු අංකය | අනුමත ව්‍යාපෘතියේ ස්වරූපය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | වැය වූ මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | |
| | උදා :- 1. නිවාස ඉදිකිරීම. | | | |
| | 2. ශිෂ්‍යත්ව ලබා දීම. | | | |
| | 3. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | | | |
| | 4............................................ | | | |
| | 5.......................................... | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| * මුළු වියදම | | | | |

✶ **සටහන :**
කලාප සමාද්ධි කළමණාකරු වෙතින් ලද කලාප වියදම් වාර්ථා වල එකතුවට මෙම මුළු වියදම සමාන විය යුතුය.

| **සකස් කළේ :** | **පරීක්ෂා කළේ :** | **සහතික කළේ :** |
|---|---|---|
| සමාජ සංවර්ධන සහකාර | සමෘද්ධි කළමනාකරු | ප්‍රාදේශීය ලේකම් |
| අත්සන......................... | අත්සන......................... | අත්සන......................... |
| දිනය........................... | දිනය........................... | දිනය........................... |
| ( නිල මුද්‍රාව ) | ( නිල මුද්‍රාව ) | ( නිල මුද්‍රාව ) |

ඇමුණුම **- vi**

අධ්‍යක්ෂ

ප්‍රජාමුල සංවිධාන අංශය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

**සමෘද්ධි කොඩි මුදලින් සිදු කරන ලද අනුමත ව්‍යාපෘති වලට අදාළ දිස්ත්‍රික් වියදම් වාර්ථාව**

**.......................................දිස්ත්‍රික්කය**

| අනු අංකය | අනුමත ව්‍යාපෘතියේ ස්වරූපය | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | වැය වූ මුදල ( රු. ශත. ) |
|---|---|---|---|---|
| | | ගැහැණු | පිරිමි | |
| | උදා :- 1. නිවාස ඉදිකිරීම. | | | |
| | 2. ශිෂ්‍යත්ව ලබා දීම. | | | |
| | 3. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් | | | |
| | 4............................................. | | | |
| | 5............................................. | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| *** මුළු වියදම** | | | | |

✶ **සටහන :**

මුලස්ථාන කළමණාකරු වෙතින් ලද **ප්‍රාදේශීය** වියදම් වාර්ථා වල එකතුවට මෙම මුළු වියදම සමාන විය යුතුය.

**සකස් කළේ :** **නිර්දේශ කළේ :** **අනුමත කළේ :**

1.ප්‍රජාමුල විෂයභාර සමෘද්ධි කළමනාකරු නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ
2.සමාජ සංවර්ධන විෂය භාර කළමනාකරු

1.අත්සන.......................... 2.අත්සන................. අත්සන....................... අත්සන........................
දිනය........................... දිනය....................... දිනය......................... දිනය...........................
( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව ) ( නිල මුද්‍රාව )

**1. ජාතික මට්ටම**

**ස්ථානය :- (ප්‍රථම/දෙවන / තුන්වන ස්ථාන ලබාගත් දිස්ත්‍රික්ක පමණක් සම්පූර්ණ කළ යුතුය)**

*ඇමුණුම vii*

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ නම | |
| රැස්කළ මුදල | |
| දිස්ත්‍රික් ලේකම්ගේ නම | |
| දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ නම | |
| දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂකගේ නම | |
| දිස්ත්‍රික් සමාජ සංවර්ධන විෂය කළමනාකරුගේ නම | |
| දිස්ත්‍රික් ප්‍රජාමූල විෂය කළමනාකරුගේ නම | |
| දිස්ත්‍රික් සමාජ සංවර්ධන නිලධාරියාගේ නම | |

**2. දිස්ත්‍රික් මට්ටම**

**ස්ථානය :- (ප්‍රථම ස්ථානය පමණි)**

*ඇමුණුම viii*

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ නම | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම | |
| රැස්කළ මුදල | |
| ප්‍රාදේශීය ලේකම්ගේ/ මූලස්ථාන කළමනාකරු ගේ නම | |
| බැංකු සමිති කළමනාකරුගේ නම | |
| සමාජ සංවර්ධන සහකාරගේ නම | |
| ප්‍රජාමූල විෂයභාර නිලධාරියාගේ නම (DO) | |
| ප්‍රාදේශීය සංවිධානයේ සභාපති/ ලේකම්ගේ නම | |

**3. ප්‍රාදේශීය මට්ටම (ප්‍රථම ස්ථානය පමණි)**

*ඇමුණුම ix*

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ නම | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම | |
| රැස්කළ මුදල | |
| වැඩිම ආදායම් ඉපයූ බැංකුවේ නම | |
| බැංකු කළමනාකරුගේ නම | |
| බැංකු කලාප සහකාරගේ නම | |
| පාලක මණ්ඩල සභාපතිගේ නම | |

*ඇමුණුම් X*

**4. දිස්ත්‍රික්කයේ වැඩිම අදායම් ඉපයූ ප්‍රජාමූල සංවිධානය ඇගයීම (ප්‍රථම ස්ථානය පමණි)**

| | |
|---|---|
| දිස්ත්‍රික්කයේ නම | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම | |
| රැස්කළ මුදල | |
| ප්‍රජාමූල සංවිධානයේ නම | |
| එම සංවිධානය අයත් සමාජ සංවර්ධන සහකාර නිලධාරියාගේ නම | |
| ප්‍රජාමූල සංවිධානය අයත් වසම භාර සමෘද්ධි සංවර්ධන නිලධාරියාගේ නම | |
| ප්‍රජාමූල සංවිධාන සභාපතිගේ නම | |

ඉහත සඳහන් තොරතුරු සියල්ල සත්‍ය බවට,

සකස් කළේ

සමාජ සංවර්ධන නිලධාරි

නිර්දේශ කළේ

සමාජ සංවර්ධන/ ප්‍රජාමූල විෂය කළමනාකරු

අනුමත කළේ

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ